**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**(සිංහල භාෂා ඒකකය)**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023**

**පාසල් මට්ටම**

1) අපේක්ෂකයාගේ නම :- ........................................................................

(මුලකුරු සමඟ නම පැහැදිලිව ලියන්න.)

2) විදුහලේ නම හා ලිපිනය :- ....................................................................

...................................................................................................................

3) පාසල් වර්ගය :- 200 ට අඩු/ 201-500/ 501 ට වැඩි

4) කලාපය :- ...............................................................................................

5) කොට්ඨාසය :- ........................................................................................

---------------------------------------------------------------------------------------------------------

**ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන**

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

පළමු කොටසින් එකක් ද දෙවන කොටසේ (අ) යටතේ එකක් ද (ආ) යටතේ එකක් ද වශයෙන් තෝරාගෙන ප්‍රශ්න <u>තුනකට</u> පමණක් පිළිතුරු සපයන්න.

<u>1 කොටස</u>

01) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු රචනාවක් ලියන්න.

(1) විද්‍යාවේ මහිමයෙන් මානව ශිෂ්ටාචාරයට සිදු වී ඇති මහපත් දෑ අතරින් වෛද්‍ය විද්‍යාවට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. බටහිර වෛද්‍ය ක්‍රමය මෙන් ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් අද අප රටේ ප්‍රචලිත ව පවතී. එහෙත් විද්‍යාවේ දියුණුවට පෙර සිට ම මිනිසාගේ නිරෝගී බව පිළිබඳ ව ආයුර්වේදයේ සඳහන් වේ. ස්වභාව ධර්මය හා මිනිසා අතර ඇති බැඳීම තවදුරටත් ශක්තිමත් කරමින් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සංවර්ධනය හා සංරක්ෂණය කිරීම මගින් මිනිසාගේ නිරෝගී බව පමණක් නොව එය වර්තමාන ඩොලර් ප්‍රශ්නයට ද විසඳුමක් ගෙන දෙන්නක් බවට පත්කර ගත හැකිය.

(2) රටක පවත්නා ස්වභාවික සම්පත් අතර වන ජීවීන්ට හිමි වන්නේ උසස් තැනකි. වනසතුන් නිසා අපට අත්වන වාසි රැසකි. අද වන විට කෙටි කාලීන වාසි අපේක්ෂා කරන්නන් විසින් වන සතුන්ට කරන හානිය සුළු පටු නොවේ. මෙම ජාතික සම්පත් ආරක්ෂා කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. ඒ සඳහා මහජන සහය ද ඔවුනට නොවඩුව ලබා දිය යුතු වේ.

(3) මම උදෑසන දසතින් ඇසෙන සුමිහිරි විහඟ නද සමඟ පිබිදුණෙමි. අහස් කුස පුරා සේ ද සළු වැනි සුදු වලා පටල සමුදායකි. පසෙක ඇති නිල්වන් කෙත්යාය පිසගෙන එන්නේ සිත පුබුදන සිසිල් මඳ පවනයි. මේ උදයසිරි දසුනෙන් මම අතිශය ආහ්ලාදයට පත්විමි................................ මෙතැන් සිට කථාව ගොඩනගන්න.

(ලකුණු 60)

## 11 කොටස

### අ කොටස

1) රිදීගම විද්‍යාලයේ කලා සංගමයේ ලේකම් ඔබ යැයි සිතා කලා උලෙළ සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා ආලෝක පහසුකම් ඉල්ලමින් ප්‍රදේශයේ එබදු පහසුකම් සපයන ව්‍යාපාරික ආයතනයකට යවන ලිපියක් සකස් කරන්න.

2) අගුරුවැල්ල ගල්පාත මාර්ගය හරහා වැටී ඇති අතුරු මාර්ගයක් වන පරගල පාර වසර ගණනකින් ප්‍රතිසංස්කරණය කර නැත. මාර්ගයේ අබලන් බව නිසාම එක් ගමන් වාරයක් පමණක් යන බස් රථය ද නතර කර දමා ඇත. මෙය පාසල් ළමුන්ටත් ගම්වාසීන්ටත් බලවත් පාඩුවකි. මේ ගැන අවධානය යොමු කොට පරගල පාර ගම්වාසීන් ලෙස රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිට යැවෙන ලිපියක් ලියන්න.

(ලකුණු 20)

## 11 කොටස

### ආ කොටස

1) කෑ/දෙහි/සමන් මහා විද්‍යාලයේ වාර්ෂිකව සිදු කෙරෙන ත්‍යාග බෙදාදීමේ උත්සවය 2023.06.15 දින පැවැත්වීමට සංවිධායක කමිටුව තීරණය කර ඇත. ත්‍යාග බෙදාදීමට ප්‍රදේශවාසී ප්‍රභූ පුද්ගලයින්ගේ හා අධ්‍යාපන බලධාරීන්ගේ පැමිණීම ද අපේක්ෂිත අතර විවිධ සංස්කෘතික අංගවලින් ද උත්සවය අලංකාර කිරීමට නියමිත ය. මේ කරුණු ඇසුරු කරගෙන ත්‍යාග බෙදාදීමේ උත්සවය සඳහා සුදුසු න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

2) මේ දිනවල ප්‍රදේශය පුරා ශීඝ්‍රයෙන් පැතිර යන ඩෙංගු වසංගතය පිළිබඳ ව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

(ලකුණු 20)